**සියඹලාණ්ඩුව ප්‍රාදේශීය සභාව - 2022**

**-------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

සියඹලාණ්ඩුව ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට සියඹලාණ්ඩුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව

විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක  සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක  සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය  මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින්  විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරුකිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇතිබව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත්කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත .

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ  ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

### 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ)  (iii) වගන්තියේ සඳහන්  අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට විදුලි උපකරණ අවසන් තොගයේ වටිනාකම රු. 232,998 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | ඉදිරියේදී අදාල වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් කිරීමට කටයුතු කරමි. | නිවැරදි වටිනාකම් මත පදනම්ව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. |
| (ආ) | ප්‍රාදේශීය සංවර්ධන සහයක ව්‍යාපෘතිය සඳහා ලැබී ප්‍රාග්ධන වියදම් ලෙස දරන ලද රු. 42,380,096 ක් හා අයහාර වියදම් ලෙස දරන ලද රු.3,752,008 ක් සමාලෝචිත වර්ෂය සඳහා වන මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනයේ දක්වා නොතිබුණි. | ඉදිරි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිමේදී සුදුසු පරිදි ගිණුම් තබා එම අඩුපාඩු නිවැරදි කිරීමට උපදෙස් ලබා දුනිමි. | සියලුම ආදායම්, වියදම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ මෝටර් රථ හා කරත්ත රු. 160,000 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී නිවැරදි කිරීමට උපදෙස් ලබාදුනිමි. | සභාව සතු වත්කම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඈ) | සුභ සාධක සේවා හා පොදු පහසුකම් යටතේ දරන ලද ප්‍රාග්ධන වියදම්වලට අදාලව, මුදලින් ගෙවීම් නොකරන ලද, කර්මාන්ත ණයහිමියන් රු. 491,877 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ප්‍රාග්ධන ගෙවීම් යටතේ ඇතුලත් කර තිබුණි. | මෙම ගිණුම්කරණ අඩුපාඩුව ඉදිරි මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී සිදු නොකිරීමට උපදෙස් ලබාදුනිමි. | මුදල් ප්‍රවාහ ප්‍රකාශ පිළියෙල කිරීමේදී නිවැරදි වටිනාකම් හඳුනාගත යුතුය. |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ ඇතුළත් දේපල පිරියත හා උපකරණවල ශේෂය රු. 411,689,845 ක් වුවත් ප්‍රාග්ධන යෙදුමට ආදායමෙන් දායකවීමේ ගිණුමේ හා ප්‍රාග්ධන යෙදුමට ආධාර මගින් දායකවීමේ ගිණුමේ ශේෂයන්ගේ එකතුව රු. 412,087,959 ක් විය. | මෙම වෙනස 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි ශේෂයන් හඳුනාගත යුතුය. |
| (ඊ) | සමාලෝචිත වර්ෂයේ ඉදිකිරීම් අවසන් නොකළ ව්‍යාපෘති දෙකක වටිනාකම රු.42,383,834 ක් ස්ථාවර වත්කම් යටතේ ප්‍රාග්ධනිත කර තිබුණි. | මෙවැනි ගිණුම්කරණ අඩුපාඩු ඉදිරි මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී සිදු නොකිරීමට අදාල නිලධාරීන්ට උපදෙස් ලබාදුනිමි. | ආදායම් වියදම් නිවැරදිව වර්ගීකරණය කර හඳුනාගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (උ) | දේපල පිරියත උපකරණ යටතේ දක්වා ඇති පුස්තකාල පොත්වල වටිනාකම රු. 156,191 ක් වැඩිපුර ගිණුම්ගත කර තිබුණි. | 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි වටිනාකම් ගිණුම්ගත කළ යුතුය. |

**1.6.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එකතු වටිනාකම රු.328,862,219 ක් වූ වත්කම් විෂයයන් 02 ක් සම්බන්ධයෙන් හිමිකම් ඔප්පු හා වෘත්තීය තක්සේරුකරුවන්ගේ වාර්තා ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය. | සභාවට අයත් ඉඩම් සහ අනෙකුත් වත්කම්වල වටිනාකම තක්සේරු කර නිරවුල් කර ගැනීමට කටයුතු කරන බව දන්වමි. | සභාව සතු වත්කම්වල වටිනාකම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |

**1.7 අනුකූල නොවීම්**

**1.7.1 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත | | | |
| | 24(1) (අ) වගන්තිය | සභාව විසින් පවත්වාගෙන යනු ලබන මාර්ග ඉන්වෙන්ට්‍රියේ ඇතුළත් මාර්ග 140 ක් ගැසට් පත්‍රයේ පළ කර නොතිබුණි. | මාර්ග ඉන්වෙන්ට්‍රිය යාවත්කාලීන කර එම මාර්ග ගැසට් පත්‍රයේ පල කිරීමට කඩිනමින් කටයුතු කරන බව දන්වමි. | මාර්ග ඉන්වෙන්ට්‍රිය යාවත්කාලීනව පවත්වාගෙන යා යුතු අතර මාර්ග ගැසට් පත්‍රයේ පල කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ, | | | |
| (i) | මුදල් රෙගුලාසි 371 | සභාවේ සේවය කරන ලද සභා ලේකම්වරයකු විසින් 2019 පෙබරවාරි 07 දින ලබාගෙන තිබුණු රු.20,000 ක අත්තිකාරම් මුදල්, 2023 පෙබරවාරි 07 දින වන විටත් පියවා නොතිබුණි. | එම අත්තිකාරම් මුදල පියවීම සඳහා අවශ්‍යය කටයුතු සිදුකරන ලෙස අදාල නිලධාරි මහතාට ලිඛිතව දන්වා ඇත. | අදාල කාර්යය අවසන් වූ වහාම අත්තිකාරම් මුදල් පියවා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ii) | මුදල් රෙගුලාසි 880 හා 891 | ප්‍රාදේශීය සභාවේ ඇප තැන්පත් කළ යුතු නිලධාරීන් 19 ක් ඇප තැන්පත්කර නොතිබුණි. | ඉදිරියේදී සේවක ඇප තැන්පතු ආරම්භ කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වමි. සියලු නිලධාරීන්ගේ නම් ඇතුලත් ඇප තැන්පතු ලේඛණයක් ආරම්භ කිරීමට විෂය භාර නිලධාරිට උපදෙස් ලබා දුනිමි. | ඇප තැබිය යුතු නිලධාරීන් ඇප තැබීමට කටයුතු කළ යුතු අතර ලේඛනයක් පවත්වාගෙන යා යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ ලේකම්ගේ 2010 අගෝස්තු 17 දිනැති චක්‍රලේඛය | සභාව විසින් පවත්වාගෙන තිබුණු වීථි පහන් ලේඛනය අනුව, සභා බලප්‍රදේශයේ වීථි පහන් 1521 ක් සවිකර තිබුණද, වීථිආලෝකකරණය සම්බන්ධයෙන් ලංකා විදුලිබල මණ්ඩලය සමඟ ගිවිසුම්ගතවී නොතිබුණි. | ඉදිරියේදී මෙම කටයුතු නිවැරදිව සිදුකරන ලෙස විෂය භාර නිලධාරිණියට උපදෙස් ලබා දුනිමි. | චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 943,464 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 5,811,710 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

**2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්**

සභාපතිවරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත්කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 5,000 | - | - | - | 5,000 | - | - | - |
| (ii) | කුලී | 12,897,775 | 12,335,379 | 11,660,769 | 674,610 | 10,318,200 | 9,472,807 | 6,079,583 | 3,393,223 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,830,200 | 1,052,600 | 1,037,600 | 15,000 | 1,762,500 | 1,479,310 | 1,467,310 | 12,000 |
| (iv) | වෙනත් ආදායම් | 16,916,814 | 10,425,389 | 7,933,204 | 2,492,185 | 14,375,536 | 9,718,055 | 8,940,772 | 777,283 |
| | එකතුව | 31,649,789 | 23,813,368 | 20,631,573 | 3,181,795 | 26,461,236 | 20,670,172 | 16,487,665 | 4,182,506 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ බිල්කරන ලද රු.23,813,368 ක් වූ මුළු ආදායමින් වර්ෂය අවසාන වන විට රු.3,181,795 ක් අයකරගෙන නොතිබුණු අතර එය මුළු බිල්කල ආදායමෙන් සියයට 13 ක් විය. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කරන බව දන්වමි. | බිල් කළ ආදායම් අයකර ගත යුතුය. |
| (ආ) | සභාවට අයත් ඇතිමලේ සතිපොල විවෘත කඩ කාමර 18 කට අදාලව 2013 වර්ෂයට පෙර සිට අයවිය යුතුව පවතින රු. 65,400 ක් 2023 පෙබරවාරි 07 දින වන විටත් අයකරගෙන නොතිබුණි. | මෙම හිඟය අයකර ගැනීමට වරින් වර ලිපි නිකුත් කර තිබුණද මෙතෙක් එම මුදල අයවී නොමැත. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුය. |
| (ඇ) | සියඹලාණ්ඩුව ප්‍රාදේශීය සභාවට අයත් දෙමටබැද්ද ජල ව්‍යාපෘතියේ ජල පාරිභෝගිකයන් 130 කගෙන් 2022 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු රු. 143,632 ක හිඟ ජල ගාස්තු අයකරගෙන නොතිබුණි. | හිඟ ජල ගාස්තු ආදායම් අයකර ගනිමින් සිටින බව දන්වමි. | -එම- |
| (ඈ) | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබුණු උසාවි දඩ රු. 123,125 ක් සහ මුද්දර ගාස්තු රු.2,423,009 ක් ගෙන්වාගෙන නොතිබුණි. | හිඟ උසාවි දඩ හා මුද්දර ගාස්තු ලබා දෙන ලෙස අදාල ආයතන වෙතින් ලිපි මඟින් ඉල්ලීම් සිදු කර ඇත. | හිඟ ආදායම් කඩිනමින් ගෙන්වා ගත යුතුය. |
| (ඉ) | සභා බල ප්‍රදේශය තුළ විවිධ ආයතන/පුද්ගලයින් විසින් ප්‍රදර්ශනය කර තිබුණු ස්ථාවර ප්‍රචාරක දැන්වීම් පුවරු 73 කින් සමාලෝචිත වර්ෂයට අදාලව අයවිය යුතු රු. 374,680 ක් 2022 දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගෙන නොතිබුණි. | හිඟ මුදල් ගෙවන ලෙස අදාල ආයතන / සහ පුද්ගලයින් සඳහා ලිඛිතව දැනුම් දී ඇත. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුය. |
| (ඊ) | 2014 සිට 2021 කාල පරිච්ඡේදයකට අදාලව අයවිය යුතු රු.286,850ක සහ සමාලෝචිත වර්ෂයට අදාලව අයවිය යුතු රු. 282,800 ක හිඟ යන්ත්‍ර කුලී ආදායම් 2023 පෙබරවාරි 07 දින වන විටත් අයකරගෙන නොතිබුණි. | අයවීමට ඇති හිඟ යන්ත්‍ර කුලී මුදල් අයකර ගැනීමට කටයුතු කරමි. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුඛසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන්, ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ප්‍රාදේශීය සභාව විසින් වලංගු කාලය ඉකුත්වී තිබුණු පාරිසරික ආරක්ෂණ බලපත්‍ර 17 ක් අලුත්කිරීමට සහ අලුතෙන් හඳුනාගන්නා ලද කර්මාන්ත 07 ක් වෙනුවෙන් පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ලබාදීමට කටයුතුකර නොතිබුණි. | මේ වන විට පරිසර ආරක්ෂණ බලපත්‍ර නැවත අලුත් කිරීමේ කටයුතු සිදුකරමින් පවතින අතර ඉදිරියේදී කර්මාන්ත නියාමන කටයුතු තව දුරටත් විධිමත් කිරිමට කටයුතු කරන බව දන්වමි. | සභා බල ප්‍රදේශයේ පවත්නා කර්මාන්ත නියාමනය කළ යුතුයි. |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | සභාවට අයත් පුස්තකාල 04 ක 2000 වර්ෂයේ සිට 2022 දෙසැම්බර් 31 දක්වා කාල පරිච්ඡේදය තුල පාඨකයින්ට ලබා දී තිබුණු පිරිවැය රු. 103,429 ක පුස්තකාල පොත් 464 ක් 2023 පෙබරවාරි 07 දින වන විටත් නැවත ලබාගෙන නොතිබුණි. | අදාල පොත් හෝ පොතෙහි වටිනාකම අයකර ගැනීමට උපදෙස් දී ඇත. | පාඨකයින්ට ලබාදී ඇති පුස්තකාල පොත් නියමිත කාල සීමාව තුල නැවත ලබාගත යුතුය. |
| (ආ) | සභාව මගින් දියුණු කළ ප්‍රදේශ හඳුනාගෙන ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත්කර වරිපනම් බදු අයකිරීමට 2023 පෙබරවාරි 07 දින වන විටත් කටයුතු කර නොතිබුණි. | සභා තීරණ මත දියුණු කල ප්‍රදේශ හඳුනාගෙන ඇති අතර ගැසට් මගින් ප්‍රකාශයට පත්කිරීමට අදාල මැනුම් කටයුතු සිදුකරමින් පවතී. | දියුණු කල ප්‍රදේශ හඳුනාගෙන ගැසට් මගින් ප්‍රකාශයට පත්කර වරිපනම් බදු අයකළ යුතුය. |
| (ඇ) | ප්‍රාදේශීය සභාවට අයත් සියඹලාණ්ඩුව සතිපොළ පරිශ්‍රයේ කඩකාමර 08ක් 2023 පෙබරවාරි 07 දින වන විටත් බදුදී නොතිබුණි. | මෙම කඩකාමර 08 දෙවතාවක් ප්‍රසම්පාදනය කල ද කඩකාමර ලබා ගැනීමට කිසිවකු ඉදිරිපත් වී නොමැත. | සභාව සතු කඩ කාමර බදු දී ආදායම් රැස්කර ගැනිමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | ප්‍රාදේශීය සභාවට අයත් ප්‍රජාශාලා 05 ක වටිනාකම තක්සේරුකර ගිණුම්ගතකර නොතිබුණි. | ප්‍රජාශාලා පිහිටි ඉඩම්වල ගැටළු පවතින බැවින් එම ගැටලු නිරවුල් කර ගැනිමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී. | සභාව සතු වත්කම් නිවැරදිව හඳුනාගෙන වටිනාකම ගිණුම්ගත කළ යුතුය. |
| (ඉ) | 2022 දෙසැම්බර් 31 දිනට තොග ගැලපීමේදී සමීක්ෂණ මණ්ඩලයක් පත්කර අවසන් තොග ගණනය කර නොතිබුණු අතර අදාල විෂය භාර නිලධාරීන් විසින් ලබාදෙනු ලබන ශේෂයන් පදනම් කරගෙන ගිණුම්ගත කිරීම සිදුකර තිබුණි. | 2023 වර්ෂයේ සිට ඉදිරියට සමීක්ෂණ මණ්ඩලයක් මගින් අවසන් තොග ගණනය කිරීමට කටයුතු කරමි. | අවසන් තොගය ගණනය කිරීම විධිමත් සමීක්ෂණ මණ්ඩලයක් මගින් සිදුකළ යුතුය. |

**3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල,පිරියත හා උපකරණ**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සියඹලාණ්ඩුව ප්‍රාදේශීය සභාවේ කොම්පෝස්ට් නිෂ්පාදන ව්‍යාපෘතිය සඳහා ඝණ අපද්‍රව්‍ය කැබලි කිරීමේ යන්ත්‍රයක් රු.735,000 ක් වැයකර 2022 ජනවාරි 13 වන දින මිලදීගෙන තිබුණු අතර 2023 පෙබරවාරි 06 දින වන විටත් එම යන්ත්‍රය අරමුණ සඳහා භාවිතා කර නොතිබුණි. | මෙම යන්ත්‍රය ට්‍රැක්ටරයේ T බාර් එකට සවිකර ඝණඅපද්‍රව්‍ය කැබලි කිර සිදුකරනු ලබයි. එමෙන්ම අවශ්‍යය වූ විටක මෙම කැබලි කිරීමේ යන්ත්‍රය ගලවා ට්‍රැක්ටරය අදාල වෙනත් කටයුතු සඳහා යොදා ගනු ලබයි. | අදාල යන්ත්‍රය උපරිම කාර්යක්ෂමතාවයෙන් කසළ කළමනාකරණය සඳහා යෙදවිය යුතුය. |

**3.4 වත්කම් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාවට අයත් කුබෝටා අත් ට්‍රැක්ටරය, ට්‍රේලරය සහ පස්තලන යන්ත්‍රය පිළිවෙලින් 2010 සහ 2020 වර්ෂවල සිට භාවිතයෙන් ඉවත් කර තිබුණද 2023 පෙබරවාරි 07 දින වන විටත් එය අලුත්වැඩියා කිරීමට හෝ අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | අදාල යන්ත්‍ර අළුත්වැඩියා කිරීමට සහ අපහරණය කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී. | සභාව සතු අලුත්වැඩියා කළ යුතු හා අපහරණය කළ යුතු වාහන හා යන්ත්‍ර කාලීනව එම කටයුතු සඳහා යොමුකළ යුතුය. |
| (ආ) | සභාවට අයත් ජෙනරේටර් යන්ත්‍රය 2016 වර්ෂයේ සිට අක්‍රියව පවතින අතර එය අලුත්වැඩියා කිරීමට හෝ අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී මෙම ජෙනරේටර් යන්ත්‍රය අපහරණය කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව දන්වමි. | යන්ත්‍ර අලුත්වැඩියාවන් හා අපහරණයන් කාලීනව සිදුකළ යුතුය. |
| (ඇ) | සභාව සතු බැකෝලෝඩර් යන්ත්‍රය 2020 සැප්තැම්බර් 08 දින අනතුරට පත් වී තිබුණ අතර අදාල අලුත්වැඩියාව සඳහා රු.170,586 ක මුදලක් වැය වන බවට නියෝජිත ආයතනය විසින් එදිනම දන්වා තිබුණි. නමුත් අනතුර සිදු වී වසර 02 කට අධික කාලයක් ගතවී තිබුණද 2023 පෙබරවාරි 07 දින වන විටත් එය අලුත්වැඩියාකර නොතිබුණි. | අළුත්වැඩියා කටයුතු සිදුකිරීම සඳහා අවශ්‍ය අනුමැතිය ලද වහාම එය අළුත්වැඩියා කිරීමට කටයුතු කරමි. | අවශ්‍ය අනුමැතිය ලබාගෙන අලුත්වැඩියාවන් කඩිනමින් සිදුකළ යුතුය. |
| (ඈ) | සභාවට අයත් විවිධ ප්‍රමාණයන්ගෙන් යුතු ඉඩම් 25 ක මැනීම් කටයුතු සිදුකරගෙන නොතිබුණු අතර ඉඩම් 86 ක නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | මේ වන විට ඉඩම් මැනීම් කටයුතු සිදුකරමින් පවතී. | සභාව සතු ඉඩම්වල නීත්‍යානුකූල අයිතිය පවරා ගත යුතුය. |
| (ඉ) | ප්‍රාදේශීය සංවර්ධන සහයක ව්‍යාපෘතිය යටතේ නගර අලංකරණය සඳහා 2022 මාර්තු 10 දින රු. 219,500 ක් වැයකර සෝලා වීථි පහන් 10ක් සහ උපාංග කට්ටල 10ක් මිලදී ගෙන තිබුණි. විගණිත දිනය වූ 2023 මාර්තු 07 දින වන විටත් සෝලා වීථිපහන් 10 න් 02 ක් පමණක් සවිකර තිබුණු අතර ඉතිරි වීථි පහන් ගබඩාවේ පැවති බව නිරීක්ෂණය විය. ඒ අනුව මාස 06 ක වගකීම් කාලයක් සහිත රු. 137,600 ක් වටිනා වීථි පහන් 08 ක වගකීම් කාලයද ඉක්මවා මාස 06 ක් ගත වී තිබුණද ඒවා භාවිතයට ගෙන නොතිබුණි. | ඉදිරියේදී මෙවන් වැරදි අවම කර ගැනීමට කටයුතු කරමි. | මිලදී ගන්නා භාණ්ඩ කාල පමාවකින් තොරව අදාල අරමුණ සඳහා යෙදවිය යුතුය. |

**3.5 මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4 වගන්තිය පරිදි නිලධාරීන් 6 කගෙන් අයවිය යුතු සේවක ණය රු.120,560 ක මුදලක් අයකරගෙන නොතිබුණි. | සේවක ණය කඩිනමින් අයකර ගැනීමට කටයුතු කරමින් පවතී. | සේවක ණය කඩිනමින් අයකරගත යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාවේ තනතුරු 05 කට අදාලව අනුමත කාර්ය මණ්ඩලය අනුව සේවකයින් 05 දෙනෙකුගේ ඌනතාවයක් පැවති අතර 2023 පෙබරවාරි 07 දින වන විටත් එම පුරප්පාඩු පිරවීමට කටයුතුකර නොතිබුණි. | මෙම කාර්ය මණ්ඩල පුරප්පාඩු පිළිබඳව සෑම මසකම කාර්ය මණ්ඩල වාර්තාව යොමු කිරීමේදී පෙන්වා දී ඇත. | කාර්ය මණ්ඩල පුරප්පාඩු පුරවා ගැනීමට කටයුතු කළ යුතුය. |